ගී සඳලුව

See... Sandaluwa

සිසිර දිසානායක

ගී සඳළුවේදී අප බොහෝවිට මුණ ගැහෙන්නේ ගීතයකට සෘජුවම දායකත්වය දුන් කලාකරුවන්. සෘජුවම දායක වනවා යන්නෙන් අප අදහස් කරන්නේ ගීතය ලියූ, සංගීතවත් කළ හෝ ගැයූ කලාකරුවන්. එහෙත් ගීතයක් අප සවනතට ළං කරවීමේ බර කරට ගන්නා තවත් පිරිසක්ද වන බව අප අමතක කළ යුතු නෑ. ඒ අතරට සංගීත වාද්‍ය ශිල්පීන් වගේම ශබ්ද පටිගත කිරීමේ ශිල්පීන් මුලටම සිහිපත් කිරීමට පුළුවන්.

ගී සඳළුවට අද මෙවර අපගේ ඇරයුම් ලැබුවේ ගීතයට සෘජුවම දායකත්වය දුන් සම්මානලාභී ගායන ශිල්පියෙක්. මෙම ශිල්පියාගේ විශේෂත්වය වන්නේ ඔහුගේ වැඩි දායකත්වය ඇත්තේ ගීත සඳහා වයලින වාදනයයි. මව් බිමේ සිටි දක්ෂතම වයලින වාද්‍ය ශිල්පියා නමින් හැඳින්වීමට හැකි ඩී.ඩී. ගුණසේනයන් මේ දිනවල වෙසෙන්නේ මෙල්බර්න් නුවරයි. "සන්නස" වෙනුවෙන් අප ඔහුව සිය පුතණුවන්ගේ නිවහනේදී මුණ ගැසුණා.

සොඳුර මට සමුදෙන්න

හැත්තෑව දශකයේදී ගුවන් විදුලියේ උදෑසන වැඩසටහන්වල නිතර ප්‍රචාරය වුණ "සොඳුර මට සමුදෙන්න" ගීතය ගී සඳළුව වෙනුවෙන් මාතෘකාව වුණා...

"1971 වර්ෂයේ දී තමයි මම ගුවන් විදුලියේ අනියම් වාද්‍ය ශිල්පියෙක් විදිහට ගුවන් විදුලියේ වාදක මණ්ඩලයකට අවතුලත් වුණේ." ගුණසේනයන් අප හා පිළිසඳරට එක් වූවා.

"ඉතින් ඒ දවස්වල තමයි ප්‍රේමසිරි සෝමදාසයන් ඔය ප්‍රබුද්ධ ගීත පටිගත කළේ. ඉතින් මාස්ටර්ගේ නුගතක් වැඩවල වයලින් වාදන වලට මාව තමයි ගත්තේ. ඉතින් මම, එඩ්ගා පෙරේරා, සේන වීරසේකර වගේ අපි කීප දෙනෙක් සහාය ගායනාවලටත් එකතු වෙනවා ඔය වැඩසටහන් වලදී...."

"ඉතින් දවසක් පටිගත කිරීමක් කරන වෙලාවෙ ගායන ශිල්පියා ඇවිත් හිටියේ නෑ. ඉතින් මාස්ටර්(ර්) කිව්වා" "ඔන්න ඕක ගුණසේන ගායනා කරන්න කියලා. මං ඉතින් එකපාරටම කැමති වුණේ නෑ. ඒත් මාස්ටර්:

"නෑ නෑ කොහොම හරි කියන්නකො. වචන ටික මට සද්දෙ ඇහෙන්න කිව්වොත් ඇති" කියලා කිව්වා. ඉතින් මම අකැමැත්තෙන් වුණත් ගායනා කළා.

මම විවාහ වුණේ ඊට ටික දවසකට පස්සේ. මාස්ටර්(ර්) මම පෝරුවට නඟින වෙලාව දැනගෙන හරියටම ඒ වෙලාවට මේ ගීතය ගුවන් විදුලියෙන් ප්‍රචාරය වෙන්න සැලසැස්සුවා. ඒක මට අද වගේ මතකයි...."

ඩී.ඩී. ගුණසේනයන්ගේ ප්‍රිය බිරිඳ අප අතරින් වෙන් වී වැඩි කාලයක් වුණේ නෑ. මෙල්බර්න් නුවර වසන සිය පුතුගේ නිවහනට පැමිණීමට එක් හේතුවක් වූයේත් එම වියෝවයි.

"ප්‍රේමසිරි සෝමදාස මාස්ටර් මට හරිම ආදරෙයි. මමත් ඒ වගේම තමයි..." සෝමදාසයන්ගේ වාද්‍ය මණ්ඩලයට එක්වීම පිළිබඳව අප විමසිලිමත් වූවා.

මගේ අයියගේ යාළුවෙක් මාව එක්ක-රගෙන ගියා මාස්ටර් ගාවට. ඒ ඔය බැලේ, ඔපෙරා එහෙම කරන කාලෙ. මම එතකොට පොඩියි. කොයිතරම් පොඩිද කියනවනම් මං හරි බයයි කළුවරට. මාස්ටර්ගේ ගෙදර ඉඳන් බැහැලා එන හරිය රෑ වුණාම කළුවරයි. ඉතින් පුනුණු වීම් ඉවරවෙලා කළුවරේ එළියට බැහැලා එන්න බය හින්දම නැවතුණා. ඉතින් ගුවන් විදුලියේදී ම තමයි මම ආයෙත් මාස්ටර්ව මුණගැහුණේ."

අප ගුණසේනයන්ගේ අතීතය වෙත යොමු වුණේ කුඩා කල පටන්ම ඔහු තුළ වූ සහජ හැකියාවක් පිළිබඳව දැනගැනීමේ අදහසින්.

"මම මුලින්ම චිත්‍රපටියකට වයලිනය වාදනය කළේ වයස අවුරුදු දොළහේදී. චිත්‍රපටියේ නම "සුනිලා" මුලින්ම ගීතවල කොටස් තමයි වාදනය කළේ. මට මතකයි පර්ල් කුරේ කියන රූපින රැපින තමයි ඒ චිත්‍රපටියේ රගපෑවේ. "මල්ලි හරි ලස්සනට වයලින් එක ගහනවනේ....." කියලා එයා මාව අඟය කරපු හැටි මට මතකයි. ඒ වගේම "සමුදායමී" කියන දෙමළ චිත්‍රපටියටත් මම වාදනය කළා.

මගේ පියා ටවර් හෝල් සංගමයක කාරක සභිකයෙක් විදිහට කටයුතු කළා. ඉතින් ඒ කාලේ හිටපු ශිල්පීන් බොහෝ දෙනෙක් අපේ නිවහනට ආව ගියා. සමහරු දුර ඉඳන් ආව අය. රෑට නවතින්නෙත් අපේ ගෙදර. ඉතින් රෑට සාජ්ජේ එහෙමත් ඒ අය එකතුවෙලා කරනවා. අපේ පියා හොඳ රසිකයෙක්. ඒ වගේම අතමිටත් තිබුණ නිසා ඒ අයට ඔය විදියට සැළකුවා. අපේ ගෙදර තබ්ලා, වයලින්, මැන්ඩලින්, සර්පිනා වාගේ වාද්‍ය භාණ්ඩත් ඔක්කොම වගේ තිබුණා. ඒ වුණාට ඒ දවස්වල ඕවට අත තියන්නවත් තාත්තා දුන්නේ නෑ. ඒ වුණත් ගෙදර තිබුණ බන්දේසියකට තට්ටු කරමින් මාත් ඔය සාජ්ජවලට දායක වුණා. ඉතින් අම්මා කියනවා ඔය ආව ශිල්පීන් කිව්වලු "කොල්ල තම් හොඳ සංගීතකාරයෙක් වෙයි" කියලා. ඉතින් පස්සේ කාලෙක ඒ අයම විටින් විට ඔය රාග එහෙම මට ඉගැන්නුවා."

"අපේ ගෙදර හැමෝටම සංගීතය පුළුවන්. අපි ඒ දවස්වල හිටියේ කොළොන්නාවෙ. ඉතින් සංගීත වැඩක් ගමේ තිබුණොත් අපිට තමයි කතා කරන්නේ. අයියලා තුන්දෙනා තමයි වැඩියෙම ගියේ. ඒ හැමෝටම තබ්ලා, සර්පිනා, ඩොල්කි වාදනය කරන්න පුළුවන්කම තිබුණා. ලොකු නංගීන් සිතාරය වාදනය කළා. කවුරුවත් කියලා දීලත් නෙවෙයි ඒ. ගායනයත් ඒ වගේම තමයි. දැන් මගේ දුවයි පුතයි වුණත් ඒ වගේ තමයි මම කියලා දීලා නෑ. ඒ වුණත් හොඳින් ඒ දේවල් කරනවා තමන්ම ඉගෙනගෙන.

"ප්‍රේමසිරි සෝමදාසයන්ගේ සංගීත වැඩ සහටන්වල වගේම, ආර්. මුත්තුසාමි මාස්ටර්, ආර්.ඒ. චන්ද්‍රසේන මාස්ටර්, ලතිත් මාස්ටර්, සෝමදාස ඇල්විටිගල, ප්‍රේමසිරි අතුකෝරළ, ලයනල් අල්ගම, අමරදේව තුමා වගේ ජ්‍යෙෂ්ඨ වගේම දක්ෂ සංගීතඥයින්ගේ සංගීත වැඩසටහන්වලට මම වාදනයෙන් සම්බන්ධ වුණා. ඒක තමයි මගේ ජීවිතයේ මම වඩාත්ම අගය කරන්නේ. ඒ අතරින් අමරදේව තුමාව මුණ ගැසීම වඩාත්ම සුවිශේෂී බව නොසැලී කියන්න කැමතියි. එතුමාගේ නිත්‍ය වයලින වාදකයා ලෙසින් අද වනතුරුත් කටයුතු කිරීම තමයි වටිනාම වරප්‍රසාදය කියලා මම සලකන්නේ"

මැතකදී ඩී.ඩී. ගුණසේනයන් "අරුංගල්" ටෙලි නාට්‍යයේ තේමා ගීතය ගායනා කිරීම වෙනුවෙන් වසරේ දක්ෂතම ගායන ශිල්පියා වශයෙන් සම්මාන කීපයක්ම ලැබුවා. ඒ පිළිබඳවයි ඉක්බිතිව අප යොමු වූයේ.

"අරුංගල්" නාට්‍යයේ පිටපතේ වයලින් වාදන තරඟ වගයක් ඇතුලත් වුණා. කළණි පෙරේරායි මායි ඒ වෙනුවෙන් වයලින් වාදනය කළා. ඉතින් මේ ටෙලි නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා ෂෙල්ටන් පෙරේරා මහත්තයා වගේ ගායනා කරන කෙනෙක් හෙව්වා තේමා ගීතය ගායනා කරන්න. ඉතින් සංගීත අධ්‍යක්ෂණය කරපු සරත් වික්‍රම තමයි මාව යෝජනා කරලා තියෙන්නේ. ඉතින් අපි පටිගත කිරීම කළා. එදා ම කීප දෙනෙක් කිව්වා මේකට නම් සම්මානයක් ලැබෙයි කියලා. සින්දුව හරියටම ගැලපුණා. ඒ වගේම තිරයට ගැලපෙන කට හඬක් තියායි එහෙම ඒ අය කිව්වේ.

මුලින්ම සුමති ටෙලි නාට්‍ය උත්සවයේයි, ඕ.සී.අයි.සී. සම්මාන උළෙලේයි මට හොඳම ගායනයට සම්මාන ලැබුණා. ඊට පස්සේ රාජ්‍ය ටෙලි නාට්‍ය සම්මාන උළෙලේදීත් හොඳම ගායනයට සම්මානය ලැබුණා" ඉතින් මගේ වයසේ හැටියටයි, වයලින වාදකයෙක් හැටියටයි ගායනයට දැක් වූ කුසලතාව සළකලා මේ සම්මාන තුනක් ලැබීමේ සුවිශේෂත්වයක් තියෙනවා කියලයි මට හිතෙන්නේ. ඒ වුණත් මාධ්‍යවලින් ලැබුණ අඟය කිරීම ප්‍රමාණවත් වුණා ද කියන එක නම් ගැටළුවක්."

ගුණසේනයන් නිහතමානී ලෙස සිනාසුණා. මව්බිමේ වාද්‍ය වෘන්දයක නැතිවම බැරි වයලින වාද්‍ය ශිල්පියෙකු අද විදේශ ගතව සිටින්නේ ඇයිද කියන කාරණාව ඒ අවිහිංසක සිනාවේ රැඳී තිබුණා.

කලාව වෙනුවෙන් කළ සේවය අගයමින් ඩී.ඩී. ගුණසේන යන්ට වසර 2006 දී රාජ්‍ය සංගීත සම්මාන උළෙලකදී සම්මානයක් පිරි නැමුණා. එමෙන්ම "කලා තුෂණ" වැනි සම්මාන වලින් ද ගුණසේනයන් අගැයීමට ලක්වුණා.

නිහඬව දශක පහක් වැනි කාලයක් පුරාවට හෙළ ගී මියැසිය වෙනුවෙන් සිය නිසග කුසලතාවත්, ව්‍යුත්පත්තියත්, සතත අභ්‍යාසයත් නිසා ලද වාද්‍ය පන්නරය දායක කළ ඩී.ඩී. ගුණසේනයන්ගෙන් අප සමු ගන්නේ පාඨකයින් වෙනුවෙන් අපගේ කෘතඥතාව පළ කරමින්.

කුංජ නාදය

''කොහොමද පුරෝහිත රටේ සංවර්ධනය? ඕන්න දැන් මත්තලටත් ජාත්‍යන්තර ගුවන් තොටුපොලක්.''

''අපූරුයි මහ රජණෙනි. දැන් අපිට ජාත්‍යන්තර ගුවන් තොටුපොලවල් දෙකයි''

''මම එන්නුන්ට කිව්වා මේ අවුරුද්ද අවසන් වෙනකොට කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයේ වැඩ ඉවර කරලා බාරදෙන්න කියලා''

''පංකාදුයි. එතකොට අපිට අධිවේගී මාර්ගත් දෙකයි''

'' ඔන්න මම මාතරත් මගේ නමෙන් ඉස්කෝලයක් විවෘත කළා''

''එළ. එහෙනම් අපිට මහා රාජපක්ෂ විද්‍යාලත් දෙකයි''

''මම මලයට කිව්වා රට ටිකක් පොලිෂ් කරලා ගන්න පොලිසියට අමතරව බොදු බල පොලිසියකුත් ගෝමි කරලා ගන්න කියලා''

''මම හිතුව මහ රජණෙනි උන් ගෝමි වෙලා එන තාලෙට ඕකත් ඔබවහන්සේගේම වැඩක් වෙන්න ඇති කියලා. දැන් අපිට පොලිසිත් දෙකයි. අගවිනිසුරුවරුත් දෙකයි.''

''කැසිනෝ රජෙකුත් එනවා පුරෝහිත.''

'' අප්පට සිරි ගජ. එතකොට රජාලත් දෙකයිනේ. හැම එකෙන්ම දෙක දෙක දෙක දෙක, දෙක දෙක දෙක දෙකනේ රජණෙනි''

''එහෙනං. බැක බැක බැක බැක, බැක බැක බැක බැක ''

ම.රා. සාදේ